# කොක්එබේ පැරණි මානව ජනාවාස ගොඩැල්ල හඳුනාගැනීම උදෙසා පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

ඩී.එම්. නදීර හර්ෂජිත් දිසානායක

පුරාවිද්‍යාව හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
nadeeraharsha091@gmail.com

ප්‍රමුඛ පද: කොක්එබේ, පූර්ව ඓතිහාසික, ජනාවාස පුරාවිද්‍යාව

## හැඳින්වීම

කොක්එබේ පුරාවිද්‍යා ස්ථානය පිළිබඳ ව අධ්‍යයනය කරන විට නිශ්චිත සාධක මත පදනම් ව පූර්ව ඓතිහාසික අවධියේ පටන් අද දක්වා ම වන සාධක හඳුනාගැනීමට හැකි ය. ඇතැම් විට එය ප්‍රාග් ඓතිහාසික අවධිය දක්වා ම ඈත අතීතයකට ගමන් කිරීමට ඉඩකඩ තිබේ. කොක්එබේ වදකහගලහින්න කන්ද ආශ්‍රිත ව හඳුනාගත හැකි තිරුවාන අවශේෂ ඒ සඳහා යම් තරමකට සාධක අනාවරණය කරයි. පූර්ව ඓතිහාසික අවධියේ මහාශිලා සුසාන සංකීර්ණය ද මුල් ඓතිහාසික අවධියේ සාධක දක්වන පූර්ව බ්‍රාහ්මී අක්ෂර සහිත ලෙන් සංකීර්ණය ද ඓතිහාසික අවධියේ බෞද්ධ ආරාම සංකීර්ණය ද එකී අඛණ්ඩ ජනාවාසකරණයකට අදාළ ව ශේෂ වූ පුරාවිද්‍යාත්මක තොරතුරු ලෙස පෙන්වාදීමට හැකි ය. මෙකී වසර දහස් ගණනක මානව ක්‍රියාකාරීත්වයකට ලක්වූ භූමියක වාසය කළ මානවයාගේ ජනාවාසය පැවතියේ කිනම් ස්ථානයක ද යන ගැටළුව පුරාවිද්‍යා පර්යේෂකයෙකුට නිතැතින් ම ඇති වෙයි. එබැවින් මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ එම පැරණි මානව ජනාවාසය ස්ථානගතව තිබූ ප්‍රදේශය පිළිබඳ ව අනාවරණය කර ගැනීම වේ.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා ප්‍රධාන වශයෙන් ම දත්ත රැස්කිරීමේ හා වාර්තා කිරීමේ ක්‍රමවේදය ලෙස භාවිත කරන ලද්දේ ක්ෂේත්‍රය හා සම්බන්ධ ව සිදු කරනු ලබන ක්‍රියාකාරකම් ය. ක්ෂේත්‍රයේ සිදු කරන ගවේෂණ ක්‍රියාවලියක් ද සාධක ලැබෙන ස්ථානයන්හි සැලසුම් ඇඳීම්, ඡායාරූප ගැනීම හා සිතියම් සකස් කිරීම යන කාර්යයන් ඒ සඳහා යොදා ගන්නා ලදී. විශේෂයෙන් ම ක්ෂේත්‍රයේදී හමුවන පුරාවස්තු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම සිදු විය.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

කොක්එබේ වදකහගලහින්න කන්දට නැගෙනහිරින් පිහිටි උස් භූමිය තුළ කිසිදු පුරාවිද්‍යාත්මක සාධකයක් හමු නොවන හෙයින් වදකහගලහින්න කන්දත් යාන් ඔයත් අතර කලාපයට වැඩි අවධානයක් යොමු කරන්නට සිදුවිය. විශේෂයෙන් ම යාන්ඔය පිටාර තැන්න තුළ ජනාවාස සකස්කර ගැනීම අනතුරුදායක වන හෙයින් ඒ සඳහා උස් භූමියක් යොදා ගන්නට ඇත යන උපකල්පනයේ පිහිටා මෙම අධ්‍යයනය සිදු කරන ලදී. ඒ අනුව සුසාන සංකීර්ණයට මීටර් 200 පමණ උතුරු දෙසින් පිහිටා ඇති උස් භූමිය මානව සාධක හමුවන සුවිශේෂී භූමියක් වශයෙන් හඳුනාගන්නට හැකි විය. මෙම භූමිය නැගෙනහිර දිශාවෙන් වැවට ද අනෙක් දිශාවන්ගෙන් කුඹුරුවලින් ද සීමා

වන අතර සාපේක්ෂ ව මීටර් 2කට වඩා උසින් යුක්ත ය. අක්කර 20ක පමණ භූමි ප්‍රමාණයක් අයත් වන මෙම උස්බිම වර්තමානයේ හේන් වගාව සඳහා භාවිත වේ. අතීත මානව ජනාවාසය ලෙස මෙහි හඳුනාගනු ලබන්නේ මෙම භූමියයි.

මෙම කලාපය තුළ මතුපිට ගවේෂණයකින් අනතුරු ව අතීත මානව කෘති රාශියක් හඳුනාගන්නට අවස්ථාව ලැබුණි. පසුගිය කාල පරිච්ඡේදය පුරාම සිදු වූ හේන් වගාව සඳහා යන්ත්‍ර යොදා පස පෙරළීම හේතුවෙන් මතුපිට අඩියක පමණවත් වියවුල් වූ පාංශු ස්තරයක් නිර්මාණය වී තිබේ. මේ හේතුව නිසාවෙන් පහළ පස් ස්තරයන්හි තිබූ මානවකෘති රාශියක් පොළොව මතුපිටට විතැන් වී ඇත. ඒ අතර මැටි බඳුන් කැබලි, ගඩොල් හා යබොර අවශේෂ ඉතා සුළභය. හමුවන මැටි බඳුන් කැබලි අතර ගැටි කොටස් මෙන් ම බඳ කොටස් ද පවතින අතර ඒවා ඒවායේ ප්‍රමාණය අනුව විශාල පරාසයක විහිදීයාමක් හඳුනාගත හැකි ය. අවධානයට ලක්වූ කැබලි සියල්ලම පාහේ සාමාන්‍ය රක්ත වර්ණ (Plain ware) මැටි බඳුන් වේ. ගැටි කැබලි බහුතරයක් විශාල ප්‍රමාණයේ ඒවා වූ අතර ඇතුල් පැත්තේ නිර්මාණාත්මක ලක්ෂණ සළකුණු කර තිබේ. ඒ අනුව ඒවා මුළුතැන්ගෙයි භාවිත බඳුන් වූවාට සැක නැත.


මීට අමතර ව බහුල වශයෙන් යබොර අවශේෂ හඳුනාගත හැකි ය. ඒවා ද විවිධ ප්‍රමාණයෙන් දැකිය හැකි නමුත් සෙ.මී. 10ක පමණ විෂ්කම්භය සහිත අවශේෂ බහුල වශයෙන් විහිදී පවතී. මෙම සාධකයෙන් පැහැදිලි වන්නේ මෙම භූමිය තුළ විශාල වශයෙන් ලෝහ කර්මාන්තය පැවතී ඇති බවයි. මධ්‍ය යාන්ඔය නිම්නය ලෝහ කර්මාන්තය නිසා සුවිශේෂී වන බව පූර්ව පර්යේෂකයන් හෙළිදරව් කර තිබේ (මැන්දිස්, අබේවර්ධන, දිසානායක 2015: 11-14). මේ එහි තවත් අවස්ථාවක් විය හැකි ය.

මීට අමතර ව මෙම උස් භූමිය තුළ ගල් කණු සාධක දැකිය හැකි අතර ඒවා නිර්මාණය කිරීමට අවශ්‍ය පාෂාණ විභේදනය කර ගැනීමට යෙදූ ගල් කුඤ්ඤ සළකුණු පැහැදිලි ව හඳුනාගත හැකි වේ. මේ සාධක අනුව ස්ථිර වශයෙන් නිර්මාණය කළ ගොඩනැගිල්ලක් මෙම ක්ෂේත්‍රය තුළ පවතින්නට ඇති බවක් හඳුනාගත හැකි වුවත් වගා කටයුතු හේතුවෙන් සිදු වූ විනාශවීම් හා විතැන්වීම් කරණ කොට ගෙන ගොඩනැගිල්ලක් පැවති ස්ථානයක් නිශ්චිත ලෙස හඳුනාගැනීමට අපහසු ය. කෙසේ නමුත් මීට පෙර අවස්ථාවක ශිලාමය සමාධි බුදු පිළිමයක් මෙම භූමියෙන් හමු වී ඇති බව ද සැළකිල්ලට ගත යුතු වේ. ප්‍රදේශයේ ජනතාවගෙන් ලැබුණු තොරතුරු අනුව එම බුද්ධ ප්‍රතිමාව මේ වන විට අනුරාධපුර කෞතුකාගාරයේ තැම්පත් කර තිබේ. ඒ අනුව මෙහි නිශ්චිත වශයෙන් ම බෞද්ධාගමික ගොඩනැගිල්ලක් පවතින්නට ඇති බවත් ශේෂ වී පවතින ගල් කණු සාධක එම ගොඩනැගිලිවලට අයත් වූ ඒවා විය හැකි බවත් උපකල්පනය කළ හැක.

කොක්එබේ පුරාවිද්‍යා ක්ෂේත්‍රය තුළ පවතින පාරිසරික ලක්ෂණ පිළිබඳ අධ්‍යයනය කරන විට පැහැදිලි වන කරුණක් වන්නේ යාන්ඔයෙහි වර්තමාන පිටාර තැන්නට ඔබ්බෙන්, එනම් පිටාර අවස්ථාවකදී හානියක් නොවන ආකාරයෙන් මහාශිලා සුසානය මෙන් ම මෙහි හඳුනාගත් ජනාවාස ගොඩැල්ල ද පිහිටා තිබෙන බවයි. යාන්ඔයේ සිට මීටර් 500ක් පමණ වූ පිටාර සීමාවක් තුළ මෙම කලාපය හඳුනාගත හැකි වේ. මෙම ජල පිටාර තැන්න අතීතයේ සිට මානවයාගේ ගොවිබිම් සරු කරන්නට අවශ්‍ය කරන සාධක සපයන්නට ඇත. ජනාවාස ගොඩැල්ලත් 'එබ' යනුවෙන් හැඳින්වෙන ජල මූලාශ්‍රයත් අතර වර්තමානයේ පවා ක්‍රියාත්මක ගොවිබිම් අතීත මානවයාගේ මුල් ගොවිබිම් වූවාට සැක නැත. මෙම

භූමියට වියළි කාලයේදී එබ ආශ්‍රයෙන් ජලය සපයා ගැනීමට හැකියාව පවතී. එමෙන් ම ගොඩැල්ලට උතුරින් පිහිටන කුඹුරුවලට ජලය ලැබෙන්නට ඇත්තේ වාරිනිර්මාණය පදනම් කරගෙන විය යුතු ය. ඇතැම් විට ඓතිහාසික අවධියේදී වාරි පද්ධතිය සංවර්ධනය වීමත් සමඟ එබට සමීප කුඹුරු ඉඩම් වලට වඩා වැවට සමීප කුඹුරු කෘෂිකර්මාන්තය සඳහා ප්‍රයොජනවත් වන්ට ඇත. ඒ අනුව ඓතිහාසික අවධිය වන විට මෙම ගොඩැල්ල මත පැවති ජනාවාසය ස්ථාවර තත්ත්වයකට වර්ධනය වූ බව පැහැදිලිය. එම ස්ථාවරත්වය වදකහගලහින්න කන්දෙහි නිර්මාණය වූ බෞද්ධ ආරාම සංකීර්ණය තුළින් මැනවින් පිළිඹිබු වේ. මේ හේතු කාරණා සළකා බලන විට කෘෂිකර්මාන්තය මූලික ජීවනෝපාය කරගත් ජන කොට්ඨාසයකට අවශ්‍ය කරන සියලු අවශ්‍යතාවන් මෙහි සකස් වී පැවති බව හඳුනාගන්නට හැකි ය.

එසේ ම ඇතැම් විට ප්‍රාග් ඓතිහාසික අවධියේ මානවයා මෙහි වාසය කළේ නම්, ඔවුන්ට අවශ්‍ය කරන මූලික අවශ්‍යතාවන් සියල්ල වදකහගලහින්න පදනම් කරගෙන නිර්මාණය වී ඇති භූගෝලීය පරිසරය තුළ හොදින්ම හඳුනාගන්නට හැකි ය. මධ්‍ය යාන් ඔය නිම්නය ආශ්‍රිත මානව ජනාවාස කටයුතු ප්‍රාග් ඓතිහාසික මධ්‍යශිලා අවධියේ ආරම්භ වන්නට ඇතැයි උපකල්පනය කළ හැකි සාධක වවුල් ලෙන හා සංගිලිමලෙයි කන්දෙන් වාර්තා වී ඇති ශිලා පතුරු අනුව උපකල්පනය කළ හැකි ය (මැන්දිස් 2016: 150). කෙසේ නමුත් ගල්ගුහා තුළ වාසය කළ මානවයා පූර්ව ඓතිහාසික අවධිය කරා යොමුවන විට කෘෂිකාර්මික ජීවනෝපායකට ඔබින ආකාරයෙන් සිය ජනාවාස රටාව ද වෙනස් කර ගනිමින් ගොවිබිම් සමීපයට පැමිණි බව අප දන්නා කරුණකි. මෙම ලක්ෂණය ඉබ්බන්කටුව මහාශිලා සුසානය ආශ්‍රිතව ද හඳුනාගත හැකි වෙයි. ඇතැම් විට පසුකාලීන ව කටාරය සකස් කර භික්ෂූන් වෙත පූජා කරන්නට ඇත්තේ ද ඔවුන් පෙර විසූ වාසස්ථානය




ක්ෂේත්‍රයේ පිහිටීම් මට්ටම්

ම විය හැකි ය (වාහල්කඩ, 2017).

කෙසේ නමුත් ලැබෙන්නා වූ සියලු සාධක මත පදනම්ව පිහිටා විමසන විට කොක්එබේ පූර්ව ඓතිහාසික අවධියේ සුසාන සංකීර්ණය ඉදිකළ ජනයා මෙන් ම ඓතිහාසික අවධියේදී බෞද්ධ ආරාම සංකීර්ණය ඉදිකළ ජනයා ද වාසය කළ වාසස්ථානය විය යුත්තේ මෙසේ හඳුනාගත් ගොඩැල්ල බව පැහැදිලි වෙයි. ඒ බව සැක හැර දැන ගැනීම උදෙසා පර්යේෂණ කැණීමක් සුදුසු බව යෝජනා කරන අතර. කොක්එබේ සුසාන කැණීමෙන් ලැබුණු කාලනිර්ණ අනුව අනුරාධපුර ජනාවාස වීමට සමකාලීන අවධියකම කොක්එබේ ප්‍රදේශය ද මානව ජනාවාසකරණයට ලක් වූ බව පැහැදිලි වෙයි (මැන්දිස් 2016). ඒ අනුව ඇතැම් විට අනුරාධපුර ඇතුල් නුවරට සමානව ම පූර්ව ඓතිහාසික අවධියේ පටන් වර්තමානය දක්වා වූ කාල පරාසයක මානව ක්‍රියාකාරකම්හි සාධක ඒ මගින් අනාවරණය වීමට ඉඩකඩ තිබේ.

## ආශ්‍රිත ග්‍රන්ථ


මැන්දිස්, ටී., අබේවර්ධන, එන්., දිසානායක, එස්. (2015) *මධ්‍ය යාන්ඔය නිම්නය ආශ්‍රිත පුරාණ ජනාවාස රටාව හා සංස්කෘතික භූ දර්ශනය.* **මධ්‍ය යාන් ඔය නිම්නයේ ජනාවාස පුරාවිද්‍යාව.** නිමල් ප්‍රින්ටර්ස්, කුරුණෑගල.

මැන්දිස්, ටී. ඩී. (2016) *මධ්‍ය යාන් ඔය නිම්නයේ පූර්ව ඓතිහාසික අවධියේ සුසාන ආශ්‍රිත වාස්තුවිද්‍යාව.* **The Proceedings of the Second Archaeological Research Symposium 2016**. Department of Archaeology & Heritage Management, Mihintale.

වාහල්කඩ (2017) කොක්එබේ මහාශිලා සුසාන කැණීම [online] ජාතික රූපවාහිණී සංස්ථාවः ජාතික රූපවාහිණිය, 2017/01/07, 19.00.

මැන්දිස්, ටී. ඩී. (2016) **යාන් ඔය නිම්නයේ ජනාවාසකරණය.** ඉරිදා පුවත්පත. 2016-09-25.